# යුද්ධයට විරුද්ධවන්නෝ

ත්‍රිවිධ හමුදාව හා පොලිස් විශේෂ කාර්ය බලකාය නැගෙනහිර පළාතේ ලැබූ ජයග්‍රහණ පිළිබඳ නිසොල්මනේ සිටි විවිධ ක්‍රිස්තියානි පල්ලි දැන් නැවතත් කල එළි බැස ඇත. පසුගිය දා ලංකා (ඇංග!ලිකන්) ක්‍රිස්තියානි පල්ලියෙ! ප්‍රධානියා වන චිකේරා බිෂොප්තුමා පවසා තිබුණේ යුද්ධයේ ජයග්‍රාහකයන් හෝ පරාජිතයන් හෝ නැති බව ය. ඔහු එතැනින් නොනැවතී යුද්ධය නිසා සිදුවන හිරිහැර ආදිය ගැන කතාකර සාකච්චා පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව සඳහන් කර තිබුණි. මුල දීම කිවයුතු කරුණක් වෙයි. මෙරට යුද්ධයක් නැත. ඇත්තේ කොටින්ට එරෙහි ප්‍රතිප්‍රහාර ය. ඒ ප්‍රතිප්‍රහාර කොටි පරාජය කිරීම සඳහා ය. යුද්ධයක් ගැන අප කතාකරන්නේ ඒ තේරුමෙන් ය.

යුද්ධය නිසා ම තම පැවැත්ම හිමිකරගෙන ඇති පූජකවරයකු මෙසේ ප්‍රකාශකරන්නේ කිනම් අරමුණකින් ද යන්න සිතාගැනීම අපහසු නො වේ. ආරක්ෂක හමුදා විසින් නැගෙනහිර පළාතේ දී ලබන ලද ජයග්‍රහණ ගැන අඩුම එරමින් තම සතුට ප්‍රකාශකිරීමටවත් බිෂොප්තුමාට නොහැකි වී ඇත. ඔහු ඒ පිළිබඳ සතුටක් නොදක්වනවා විය හැකි ය. නැගෙනහිර පළාතේ හමුදා ජයග්‍රහණ පිළිබඳ උත්සව පැවැත්වීමට විරුද්ධ අයකු වුව ද කොටි පරාදවීම ගැන සතුටක් නොදක්වන්නේ නම් ඒ තැනැත්තා අඩුම තරමින් කොටි හිතවතකු හෝ සිංහකලත්වයට විරුද්ධ අයකු හෝ විය යුතු ය.

බිෂොප්තුමාගේ ප්‍රකාශය ගැන අපට පුදුමයට පත්වීමට තරම් දෙයක් නොමැති නමුත් එක් කරුණක් මතක්කර දිය යුතු ය. මෙරටට ඇංග්ලිකන් ක්‍රිස්තියානි ආගම ගෙන එනු ලැබුයේ සාකච්ඡාකර නො වේ. බුදුදහම මෙරටට නිල වශයෙන් හඳුන්වාදීමේ දී ඉතා වැදගත් බුද්ධිමය සංවාදයක් සිදු වූ බවට මෙරට වංශකතා සාහිත්‍යය සාක්ෂි දරයි. මහාවංසය නො පිළිගන්නන්ට අවශ්‍ය නම් ඒ සංවාදය ද මහාවංස කතෘ මහානාම හිමියන්ගේ හෝ වෙනත් අයකුගේ හෝ ප්‍රබන්ධයක් යැයි කිවහැකි ය. ඒ එසේ වුවත් එවැනි සංවාදයක් ප්‍රබන්ධකිරීමට හෝ සමත් පුද්ගලයකු මෙරට ජීවත්වීම ගැන මම ආඩම්බර වෙමි. අද ක්වොන්ටම් භෞතික විද්‍යාවට අර්ථකථනයක් කළහැක්කේ මේ සංවාදය ඇසුරෙන් ය.

ඒ කෙසේ වෙතත් බුදුදහම නිල වශයෙන් මෙරටට හඳුන්වාදුන්නේ යුද්ධයක ප්‍රතිඵලයක් ලෙස නො වෙයි. එහෙත් ඉංගිරිසින් සමග පැමිණි ඇග්ලිකන් ක්‍රිස්තියානි ආගමට එවැන්නක් කිව නො හැකි ය. ඒ ආගම ලංකාවට පමණක් නොව වෙනත් රටවලට ද හඳුන්වා දී ඇත්තේ යුද්ධවල ප්‍රතිඵල ලෙස ය. උතුරු අයර්ලන්තයේ ප්‍රශ්නය අවසාන වශයෙන් ගත්කල ඇංග්ලිකන් ආගම එරට තහවුරුකිරීම පිළිබඳ ප්‍රශ්නයකි. එංගලන්තයේ පවා ඇංග්ලිකන් ආගම අවසානයේ දී තහවුරු වුයේ යුද්ධවල ප්‍රතිඵල ලෙස ය.

චිකේරා බිෂොප්තුමා අද ලංකාවේ ක්‍රිස්තියානි ආගමේ ප්‍රධානියා ය. මේ ආගම ඇංග්ලිකන් ක්‍රිස්තියානි ආගම ම මිස අනෙකක් නො වෙයි. එහි පරිපාලන ව්‍යුහය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇතිවුවත් ආගම ලෙස ගත්කල වෙනසක් නැත. එංගලන්තය ප්‍රංශය සමග කරන ලද යුද්ධ හා වෙනත් යුද්ධ හේතුකොටගෙන ඉංගිරිසින්ට මෙරට අයත්විය. ඉංගිරිසින් සමග එදා ඇංග්ලිකන් ආගමේ පූජකවරු ද නැව්වල නැගී සංචාරය කළහ. ඒ විවිධ කාරණා සඳහා ය. තම ආගම ලෝකය පුරා ප්‍රචලිතකිරීම මෙන් ම යුද්ධයට ගිය ඉංගිරිසි සෙබළුන්ට ආශිර්වාද කිරීම ද ඇංග්ලිකන් පූජකවරුන්ගේ කාර්යභාරයට අයත්විය.

එසේ යුද්ධ නිසා ම ලංකාවේ ද ඇග්ලිකන් ක්‍රිස්තියානි ආගම ස්ථාපිත කෙරිණි. එපමණක් නොව ඉංගිරිසින්ගේ පාලනයත් ඇංග්ලිකන් ආගමේ මෙරට පැවැත්මත් තහවුරුකිරීම සඳහා යුද්ධ රාශියක් මෙරට ද ඇතිවිණි. 1817 -18 දී හා 1848 දී සිංහලයන් ඉංගිරිසින්ට විරුද්ධව තම නිදහස වෙනුවෙන් සටන්කළ අවස්ථාවල ඉංගිරිසින් ක්‍රියාකළ ආකාරය සඳහන්වන්නේ මහාවංසයේ නොවන නිසා ඒ විශ්වාසකිරීම මෙරට පඬියන්ට ද අසීරු කරුණක් නොවිය හැකි ය. ඒ යුද්ධවල දී සිංහලයෝ ම්ලේච්ඡ අයුරින් ඝාතනය කරනු ලැබූහ. ඒ යුද්ධ නැවැත්වීමට ඇංග්ලිකන් පූජකවරුන් ක්‍රියාකළ බවක් දැනගන්නට නැත.

එදා සිංහල නායකයන් සමග සාකච්ඡාකළ යුතු යැයි කී ඇංග්ලිකන් පූජකවරුන් ගැන අපි නො දනිමු. සාකච්ඡාවෙන් ප්‍රශ්න විසඳාගැනීමට ඉංගිරිසි ආණ්ඩුකාරයන්ට උපදෙස් දුන් ඇංග්ලිකන් පූජකවරුන් ගැන දැනගැනීමට නැත.

© Prof. Nalin De Silva

සිංහල බෞද්ධයන් ලක්‍ෂ ගණනින් මරා දමද්දී මේ පූජකවරුන් සිටියේ කොහේ දැයි අපි නො දනිමු. එහෙත් ඔවුහු (ඔවුන්ගේ අනුප්‍රාප්තිකයෝ) අද කොටි වෙනුවෙන් කතාකරති. මෙහි දී ප්‍රශ්නය වනුයේ එදා යුද්ධයට විරුද්ධ නොවූ පූජකවරුන්ගේ අනුප්‍රාප්තිකයන් අද යුද්ධයට විරුද්ධවීම පමණක් නො වේ. ප්‍රශ්නය යුද්ධය නිසා ම තම ආගම මෙරට පිහිටුවාගත් හා තහවුරුකරගත් පූජකවරුන්ගේ අනුප්‍රාප්තිකයන් අද යුද්ධයට විරුද්ධ වීම ය.

මේ ප්‍රභූ පූජකවරුන් විරුද්ධවන්නේ යුද්ධයට නොව සිංහලත්වයට ය. එහෙත් ඔවුන් ජනතාවට ප්‍රකාශකරන්නේ තමන් යුද්ධය වියුක්තව යුද්ධය ලෙස ගෙන එයට විරුද්ධ වන බව ය.  එහෙත් ඒ එසේ නොවන බවට ඉහත සඳහන් දෑට අමතරව  ඉතිහාසයෙන් තව තවත් උදාහරණ සැපයිය හැකි ය. එදා පමණක් නොව පසුගිය දා ද එංගලන්තයේ කැන්ටබරියේ ආච්බිෂොප්තුමා ඉරාක යුද්ධයට පැටලීම පිළිබඳ හිටපු අගමැති බ්ලෙයාර්ට අවවාද නො කෙළේ ය. වියුක්තව ගත්කල කාහට වුව ද යුද්ධයට විරුද්ධ විය හැකි ය. එහෙත් සංයුක්තව ගත්කල ඇතැම් අවස්ථාවල යුද්ධකිරීමට සිදුවෙයි. ඒ අවස්ථා කවරේදැයි තීරණය කෙරෙන්නේ සංස්කෘතික අවශ්‍යතා, තම පුද්ගල අවශ්‍යතා, කණ්ඩායම් අවශ්‍යතා, දේශපාලන අවශ්‍යතා ආදිය පදනම් කරගනිමිනි.

චිකේරා බිෂොප්තුමා ද ඇතුළුව යුද්ධයට විරුද්ධවන්නන් සාකච්ඡා නොකරණ කරුණ ද එයම ය. අද කොටින්ට විරුද්ධව සටන් නොකළ යුතු යැයි කියන්නන් අතර එංගලන්තය (බ්‍රිතානිය යනු වේල්සය හා ස්කොට්ලන්තය එංගලන්තයේ යටත්විජිත බව වසාගැනීම සඳහා යොදන පදයක් පමණකි.) වෙනුවෙන් පෙනී මෙරට සිටින මහකොමසාරිස්වරයා ද වෙයි. මහාකොමසාරිස්වරයා ආණ්ඩුවට කියා සිටින්නේ යුද්ධ නොකරන ලෙස ය. ඒ වෙනුවට සාකච්ඡා ආරම්භකරන ලෙස ඔහු කියයි. එංගලන්ත මහාකොමසාරිස් යනු ඇංග්ලිකන් ක්‍රිස්තියානියේ මෙරට සිටින ප්‍රධාන දේශපාලන නියෝජිතයා ය. චිකේරා බිෂොප්තුමා ඒ ක්‍රිස්තියානියේ ම මෙරට ප්‍රධාන ආගමික නායකයා වෙයි.

මේ සියළු දෙනාටම අවශ්‍ය කරුණක් වන්නේ සිංහලත්වය දුර්වල කිරීම ය. හැකිනම් ඒ නැතිකිරීම ය. සිංහලත්වයෙහි සිංහල බෞද්ධ සංස්කෘතිය, සිංහල ජීවන රටාව, සිංහල දැනුම ආදිය වෙයි. බොහෝ දෙනාට කොටි සංවිධානය යනු දෙමළ ජනයාගේ සංවිධානයකි. අද ඇතැමුන් දෙමළ ජනයාගේ ප්‍රශ්න කොටි සංවිධානයෙන් වෙන් කිරීමට    උත්සාහ දරණු පෙනෙයි. බැලූ බැල්මට එහි වරදක් නැත. එහෙත් මේ ප්‍රශ්න යැයි කියන දෑ බොහොමයක් දෙමළ ජාතිවාදයේ ප්‍රශ්න වෙයි. කොටි සංවිධානය යනු දෙමළ ජාතිවාදයෙහි ආයුධ සන්නද්ධ ප්‍රධාන කණ්ඩායම වෙයි. දෙමළ ජාතිවාදය මෙරට ඇතිකරනු ලැබුයේ ඉංගිරිසින් විසිනි. ඒ ඇතිකරනු ලැබුයේ ම සිංහලත්වයට එරෙහිව ය. ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය යනු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ප්‍රබල ම සංරචකය වෙයි. මේ සංස්කෘතියෙහි ප්‍රධාන ම කාර්යයක් වනුයේ හැකිනම් ලෝකයේ අනෙක් සංස්කෘතීන් සියල්ල විනාශකිරීම ය.

යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ට ලංකාවේ නැතිකිරීමට ඇති ප්‍රධානම සංස්කෘතිය  සිංහල බෞද්ධ සංස්කෘතිය වෙයි. ඒ සංස්කෘතියෙහි ප්‍රධානීහු ඒ සඳහා දෙමළ ජාතිවාදය නිර්මාණය කළහ. අද දෙමළ ජාතිවාදයෙහි ප්‍රධාන ප්‍රකාශකයා බවට පත්වී ඇත්තේ කොටි සංවිධානය ය. එබැවින් කොටි පරාජය කිරීමට පොදුවේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට හෝ විශේෂයෙන් ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතියට හෝ අනවශ්‍ය ය. අද යුද්ධය එපා යැයි කියන සියල්ලෝ ම සෘජුව හෝ වක්‍රව හෝ කොටි සංවිධානය ලවා සිංහලත්වය හැකිනම් විනාශකිරීමේ කාර්යය සඳහා පෙනී සිටිති. එහෙත් මෙයින් අදහස්කරන්නේ මෙරට සාමාන්‍ය සිංහල ක්‍රිස්තුභක්තියන් සිංහලත්වයට විරුද්ධ බව නො වේ. සිංහලත්වයට විරුද්ධ ව ඉංගිරිසින් විසින් පුහුණු කරනු ලැබූ දෙමළ ප්‍රභූන්ට සාමාන්‍ය දෙමළ ජනයා මුළාකිරීමට හැකිවුව ද, සිංහලත්වයට විරුද්ධ ක්‍රිස්තියානි ප්‍රභූන්ට මෙරට සාමාන්‍ය සිංහල කතෝලික හා කතෝලික නොවන ක්‍රිස්තියානීන් මුළාකිරීමට නොහැකි විය. එයට හේතු දෙකක් වෙයි. පළමුවෙන් ම සිංහල ක්‍රිස්තියානි (කතෝලික හා කතෝලික නොවන) ජනයා පරම්පරා කිහිපයකට ඉහත සිංහල බෞද්ධ වීම ය. ඔවුහු තවමත් සිංහල බෞද්ධ සංස්කෘතියට අයත් වෙති. සිංහල ක්‍රිස්තියානි ප්‍රභූන් පිරිසක් නම් ඉංගිරිසින්ගේ මෙහෙයවීමෙන් සිංහලත්වයට එරෙහිව පුහුණු කරනු ලැබූහ. දෙවන හේතුව වන්නේ සාමාන්‍ය සිංහල ක්‍රිස්තියානින්ට සිංහල බෞද්ධයන් ඇසුරුකිරීමට ලැබීම ය. මේ හේතුව නිසා ද යටකී ප්‍රභූන්ට සිංහල බෞද්ධයන් ගැන බොරු ප්‍රචාරය කිරීමට නො හැකි ය. එසේ නොවන්නට දෙමළ ජාතිවාදයට අමතර ව තවත් ප්‍රශ්නයක් මෙරට ඇතිවීමට ඉඩ තිබුණි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva